**ශීර්ෂය 23 - විගණන සේවා කොමිෂන් සභාව**

-------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විගණන සේවා කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට විගණන සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) උක්ත චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව ගිණුම් ඉදිරිපත් කිරිමේදී සියළුම වටිනාකම් ආසන්නතම රුපියලට දැක්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ආසන්න රුපියලට වටයා ගිණුම් ඉදිරිපත් කරන ලෙස 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි සඳහන්ව තිබුණද, ප්‍රමාද දෝෂයකින් මෙම වසරේද පෙර වසරේදී මෙන් ශත ගණනකින් වටිනාකම සටහන් කර ඇති බවත්, ඉදිරි වසරේ සිට එලෙස ආසන්න රුපියලට වටයා ගිණුම් සකස් කිරීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කරන බවත්. |
| (ආ) උක්ත චක්‍රලේඛයේ 4.2 ඡේදය ප්‍රකාරව ගිණුම් සහතික කිරීම ලේකම්වරයා විසින් සිදුකර තිබුණද, එය ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වශයෙන් සහතික කළ බවට දක්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රමාද දෝෂයකින් මෙසේ සටහන් වී ඇති බවත්, ඉදිරියේදී එය නිවැරදි කර ගැනිමට කටයුතු කරන බවත්. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන සේවා කොමිෂන් සභාව යටතේ ආදායම් ගණන්දීමේ නිලධාරියෙකුට අදාළ ආදායම් සංකේතයක් නම් කර නොතිබුණි. විගණන සේවා කොමිෂන් සභාව විසින් වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ආදායම් සංකේත 03ක් යටතේ සමාලෝචිත වර්ෂයේදී රු.590,979 ක් රැස්කර තිබුණි. 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව ඉහත ආදායම්, ආදායම් නොවන වෙනත් ලැබීම් යටතේ සඳහන් කළ යුතුව තිබුණත් එසේ | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන සේවා කොමිෂන් සභාව අළුත් ආයතනයක් වන නිසා පූර්වාදර්ශ නොමැති බැවින් ශේෂ පිරික්සුමේ ආදායම් සංකේත ලෙස වර්ගීකරණය වි ඇති, භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ වෙනුවෙන් විගණන සේවා කොමිෂන් සභාව විසින් රැස් කරනු ලබන ආදායම්, ආදායම් ලැබීම් ලෙස සටහන් කර ඇත. ඉදිරි වසරේදී එම වටිනාකම වෙනත් ලැබීම් ලෙස යෙදීමට සටහන් කර ගන්නා ලද බව |

සඳහන් කර නොතිබුණි.

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ 2017 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය රු.6,606,589 ක් ලෙස දක්වා තිබුණද ඒසීඒ ආකෘති පත්‍රය අනුව එය රු.6,696,588 වූයෙන් ආරම්භ ශේෂයෙහි රු.89,999 ක වෙනසක් පෙන්නුම් කෙරිණි. | සෑම විටම ගිණුමේ දක්වන වටිනාකම් ඒවාට අදාළ ගිණුමේ උපලේඛනවල එකතුන්ට සමාන වන පරිදි දැක්විය යුතුය. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය මුද්‍රණ දෝෂයකින් රු.6,606,589 ක් ලෙස සටහන්ව තිබූ අතර ඒසීඒ 6 ආකෘතියේ නිවැරදි ශේෂය සටහන්ව තිබිණි. 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශේෂය සකස් කිරීමේදී 2017 දෙසැම්බර් 31 දිනට ඒසීඒ 6 ආකෘති පත්‍රයේ රු.6,696,588 නිවැරදි ශේෂය පදනම් කරගෙන ඇත. ඒ අනුව 2018 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශේෂය නිවැරදිව සකස් කර ඇත. |

**1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් යටතේ කුලී අත්තිකාරම් ලෙස රු.3,886,364 ක් හා රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම් ලෙස රු.2,596,586 ක් වශයෙන් එකතුව රු.6,482,950 ක් දැක්විය යුතුව තිබුණත්, එය රු.5,834,704 ක් ලෙස දක්වා තිබීම නිසා රු.648,246 ක වෙනසක් නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 චක්‍රලේඛනය අනුව හැමවිටම භාණ්ඩාගාර පරිගණක තොරතුරු ගිණුම්වල ඇතුළත් කළ යුතුය. | (i) හා (ii) සඳහන් පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් යටතේ දැක්වෙන රු.648,246 ක වෙනස ඇති වී ඇත්තේ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේය. |

**1.6.5 අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් සාරාංශ හා භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව වෙනත් මූලාශ්‍රවලින් ලැබුණු මුදල රු.82,173 ක් වුවද, ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද ඒසීඒ -3 ආකෘතියට අනුව එය රු.152,250 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.70,077 ක වෙනසක් | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 චක්‍රලේඛය අනුව සෑමවිටම භාණ්ඩාගාර පරිගණක තොරතුරු සමඟ එකග විය යුතු අතර, | අග්‍රිම ගිණුමේ වෙනත් මූලාශ්‍රවලින් ලැබුණු මුදල්වල වටිනාකම ලබාගෙන ඇත්තේ මුදල් පොතේ ලැබීම් මගින් වන අතර, ඒ තුළ අතුරු අග්‍රිම පියවීම් ඇතුළත්ය. ගිණුම් සාරාංශ හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල වූ |

| | | |
|---|---|---|
| පෙන්නුම් කෙරුණු අතර, එය අතුරු අග්‍රිම පියවීමෙන් ලද මුදල් බවට නිරීක්ෂණය විය. | වෙනසක් තිබේනම් ඒවා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | වෙනත් මුලාශ්‍රවලින් ලැබුණු මුදල් තුළ අතුරු අග්‍රිම පියවිමේදී ලැබෙන මුදල් ඇතුළත් වී නොමැත. රු.70,077 ක වෙනසක් ලෙස පෙන්නුම් කරන්නේ එම අගය වේ.<br>ඒසීඒ 3 ආකෘතියේ මුදල් ලැබීම් මෙන්ම ගෙවීම් පිළිබඳවද සටහන් කර ඇති අතර එහි මුදල් ගෙවීම් තුළ අග්‍රිම ගෙවීම් ඇතුළත් කර ඇත. එබැවින් ඉහත සඳහන් වෙනස ගිණුම් ශේෂයට බලපෑමක් සිදුකර නැත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1** **වියදම් කළමනාකරණය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂය අංක 23-2-1-0-1002 අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් සහ අංක 23-2-1-0-1101 දේශීය ගමන් වියදම් යන වැය විෂයයන්ට අදාළව ඉතිරිය පිළිවෙලින් සියයට 89.64 හා සියයට 93 ක් විය. | සැමවිටම අවශ්‍යතාවයනට අනුව ප්‍රතිපාදන වෙන්කර ගත යුතු වීම. | ඇස්තමේන්තු සකස් කිරීම සිදුකරන ලද්දේ 2017 වසර මැදදී වේ. ඒ අනුව විගණන සේවා කොමිෂන් සභාවට අවශ්‍ය කාර්ය මණ්ඩලය සම්පූර්ණ කරගත යුත්තේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා වන බැවින් ඒ සඳහා වරින් වර ඉල්ලීම් කළ ද නිලධාරීන් අනුයුක්ත නොකිරීම නිසා ඇස්තමේන්තුගත කළ මුදල වියදම් කිරීමට නොහැකි විය. අවශ්‍යතා හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කර ඇති නමුත් විගණන සේවා කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර හේතු මත අදාළ වියදම් දැරීමට නොහැකි වී ඇත. |
| (ආ) වැය විෂයයන් 09 කට අදාළව ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 15 සිට 81 දක්වා පරාසයක් තුළ පැවතුණි. | සැමවිටම අවශ්‍යතාවයනට අනුව ප්‍රතිපාදන වෙන්කර ගත යුතු වීම. | ජාතික විගණන පනත ක්‍රියාත්මක විම ප්‍රමාද වීමට අමතරව අපේක්ෂිත කාර්ය මණ්ඩලය ලබා ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කළද නොලැබිම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා (ආ) වගන්ති අනුව ප්‍රසම්පාදන අස්ථිත්වයක් විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වුවද, මෙම කොමිෂම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීමේදී මෙන්ම පුනරාවර්තන වැය විෂයයන් යටතේ යම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා ප්‍රසම්පාදනයක් සිදු කිරිමට අපේක්ෂා කරන්නේ නම් ඒ පිළිබඳ විස්තරද ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කළ යුතුය. | අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරියේදි සකස් කිරීමට කටයුතු කරන බව. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය අනුව ඉදිරි වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂිත සියළුම ප්‍රසම්පාදනයන් පිළිබඳ විස්තර ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කළ යුතු වුවද, කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම් පමණක් ඇතුළත් කර තිබූ අතර, පුනරාවර්ථන වැය යටතේ ප්‍රසම්පාදන කර ගැනීමට අපේක්ෂිත භාණ්ඩ හා සේවා සම්බන්ධව විස්තර ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීමේදී මෙන්ම පුනරාවර්තන වැය විෂයයන් යටතේ යම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා ප්රසම්පාදනයක් සිදු කිරිමට අපේක්ෂා කරන්නේ නම් ඒ පිළිබඳ විස්තරද ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කළ යුතුය. | මෙතෙක් ප්‍රසම්පාදන සැලසුම් සකස් කරනු ලැබුවේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීමට පමණි. පුනරාවර්තන අයිතමයන් සඳහා ද ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතු ආකාරය පැහැදිලි නොවන බැවින් ඒ පිළිබඳ උපදෙස් ලබා ගැනීමට අපේක්ෂා කරන බව. |

**3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරිම හෝ මුද්දර නැතහොත් බඩුබාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය | මුදල් රෙගුලාසි 880 පරිදි කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |

වශයෙන් වග කිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් කොමිෂන් සභාවේ එවැනි කිසිදු නිලධාරියෙකු ඇප තබා නොතිබුණි.